සෝවියට් ලේඛන

බොරිස් සුබිහෝව්

සතුන් දිහා බලා ඉගෙන...

පරිවර්තනය

මහින්ද සෙනරත් ගමගේ

සතුන් අපට දෙන ඉඟි
සහ
කියනට දත් ලැබුණු හැටි



ඩෝං! ඩෝං! ඩෝං!

ආරක්ෂිත බලකොටුවක දොරටුවට විසල් දණ්ඩකින් පහර දෙනවා. දොරටුව බිඳ වැටෙනවා. ලී කැබලි හතර අත විසිරී යනවා. මේ විසල් දණ්ඩ කෙළවර ඇත්තේ බැටළුවෙකුගේ හිසකි. අං දෙකකින් යුතු එය තනා ඇත්තේ තඹ වලිනි.

මේ පෙර දවස බලකොටු බිඳින්නට යොදා ගත් උපක්‍රමයකි.

ඇයි මේ දණ්ඩ අගට බැටළු හිසක් තිබෙන්නේ? මේ පහර දෙන දණ්ඩ සොයා ගනු ලැබුවේ පුරාතන ග්‍රීකයන් විසින්. තණ බිම් වල බැටළුවන් එකිනෙකාට ඇන ගනිද්දී උන්ගේ හිස් හා අං කොතරම් ශක්තිමත්දැයි දැක ඔවුන් පුදුම වන්නට ඇත. ඔවුනට ඇත්තේ ඉතා ශක්තිමත් හිස් විය යුතුය. ඉතිං ඔවුන් කළේ බලකොටු බිඳින දණ්ඩ කෙළවරට බැටළු හිසක් සවි කිරීමයි. එකම වෙනස වූයේ එය තඹ වලින් සෑදීම පමණයි. ප්‍රතිඵලය ඉතා සාර්ථක විය. බැටළු හිස නැති විට සිදු වූයේ දොරටුවට පහර දෙද්දී දණ්ඩ කැඩී බිඳී යාම පමණ යි. දොරටුවට එදිරිව එයට කළ හැකි දෙයක් තිබුණේ නෑ.

බොහෝ දුර ඈත කාලයේදී මිනිසා සිවිපාවුන්, කුරුල්ලන්, කෘමීන් සහ පැළෑටි දෙස පරීක්ෂාවෙන් බලන්නට පටන් ගත්තා. දුටු දෙයින් වැඩිමනක් ම ඔවුන් පුදුමයට පත් කළ ඒවා විය. තමන් දුටු මේ දේවල් ප්‍රයෝජනයට ගන්නේ කෙසේදැයි ඔවුහු කල්පනා කරන්නට වූහ.



ඔවුහු කොටියාගේ තියුණු දත් දැක ඊට ඊර්ෂ්‍යා කළහ. තමන්ට එවැනි තියුණු දත් නැත්තේ ඇයි? අලින්ගේ දැවැන්ත දළ ඔවුහු දුටහ. කෙතරම් දැවැන්ත දළද! ඔවුහු වළසුන්ගේ ශක්තිමත් නිය දුටුවෝය. මිනිසුන්ට එවන් දත්, දළ හෝ නිය නැත්තේය. ඉතිං ඔවුහු කොටියාට, අලියාට සහ වළසාට බිය වූහ. එහෙත් ඉන්පසු ඔවුහු මෙසේ කල්පනා කරන්නට ගත්හ: ඇයි අපට වළසාගේ නිය වැනි නිය සාදා ගන්නට බැරිද, අලියාගේ දළ වැනි දළ සාදාගන්නට බැරිද, කොටියාගේ දත් වැනි දත් සාදා ගන්නට බැරිද!



අසුපිට නැඟි නයිටවරයෙක්, සෙබළෙක් හෙල්ලක් රැගෙන යයි.
එය සතුගේ තිය සේ ම තියුණු ය.
එහෙත් ඊට වඩා දිගුය.

ඔවුහු තියුණු ගල් කැබැල්ලකින් පිහියක් සාදා එය දැඩු කැබැල්ලකට තබා බැන්දාහ. ප්‍රතිඵලය හෙල්ලකි. දැන් තියුණුම දත සහ දිගම නිය ඇත්තේ ඔවුන්ට ය. කොටියනි, වළසුනි බලාගෙනයි!

තියුණු සහ බර ගලක් ශක්තිමත් දණ්ඩකට සවි වීමෙන් හොඳ පොරොවක් සෑදිනි. තියුණු ගල් කැබලි කීපයක් දණ්ඩකට එක දිගට සවි කිරීමෙන් පළමු කියත බිහිවිය.

පසුව මිනිස්සු මේ සියල්ල, පොරෝ, කියත් සහ පිහි යන සියල්ල ලෝහවලින් තනා ගන්නට ඉගෙන ගත්හ.

අද දවස වන විට අපි ලෝහ වර්ග කැපුම් උපකරණ වලින් කපන්නෙමු, විසල් වානේ දැඩු වලින් පොළොවේ ගල් කුළු හාරන්නෙමු, ගස් කඳන් වානේ දත් වලින් කපා දමන්නෙමු.

මේ සියලු කපනයන් සහ දත් වර්ග මිනිසා සොයා ගනු ලැබුවේ වෙනස් වෙනස් විශාල හා කුඩා සතුන්ගේ දත් හා දළ දෙස බලමිනි.





කහ කොළ සහ සරුංගල්

පාලම් තැනිය හැකි මකුළුවා

පියාඹන්නට මිනිසා සිතූ සැටි

සරත් කාලයේදී කොළවල කොළ පාට වියැකී ගොස් කහ පාට වෙනවා. ඒත් ඒවාට ගසෙන් වෙන් වෙන්නට ඕනෑ කමක් නැත. කෙසේ වුව සුළඟ දැඩි වෙමින් කොළයක් ගසින් ඇද සීතල පොළොවට දමා ගසයි.

එහෙත් එක් කොළයක් බටයක් සේ ඇකිලී ගන්නවා. සුළඟ ඒ බටය ඇතුළින් ඇදී යනවා පමණයි. සුළ ඟට කොළය ඇද දමන්නට හැකි කමක් ලැබෙන්නේ නෑ. ඇයි? කඩදාසි කොළ කැබැල්ලක් ගෙන බටයක් සේ සාදා තද කොට එය නමන්නට උත්සාහ කොට බලන්න. දෙකට ඉරන්නට උත්සාහ කොට බලන්න. අමාරුයි නේද? ඔව්, ගසේ වක් වූ කොළය සුළඟට කඩා දමන්නට බැරි වන්නේත් ඒ ලෙසයි.



එවන් එක් කොළයක් දෙස බලා සිටි මිනිසෙක් බටයක් සේ නැමුණු කොළයක හැඩැති පාලමක් සෑදී ය.

එය දිගු පාළමකි. මීටර් දහසක් දිගු පාලමකි! එය ඉතා ශක්තිමත් පාලමක් බවට ඔප්පු විය. මක්නිසාද යත්, එය සාදා තිබුණේ ස්වභාවධර්මයේ සොයා ගැනීමක් හා සමපාතව බැවිනි.

අපි ගස් ගැන තවත් බැල්මක් හෙළමු. අතු දෙබලක අපට මකුළු දැලක සිහින් නූල් දකින්නට හැකිය.





ඒ මත වැටුණු පිණි හිරු එළියේ දිස්නය දෙයි. මකුළු දැල ලස්සනය, එලෙසම ශක්තිමත් ය. ලොකු අම්බලම්පාළුවෙක් නැතිනම් අතු රිකිල්ලක් ඒ මත වැටෙයි. එසේත් නැතිනම් සුළඟ වේගයෙන් ඒ හරහා හමා යයි. එහෙත් දැලට කිසිවක් වන්නේ නැත. එය ඉදිරියට, පසුපසට වැනෙයි, නැවෙයි, පැද්දෙයි. එහෙත් එය වෙන්වී කැඩී යන්නේ නැත.

ඉතිං මේ නිසා පෙනුමින් මකුළු දැලට සමාන ඒත් ඝන වානේ රැහැන් සහ දම්වැල් වලින් යුතුව පාලම් තැනීමට මිනිස්සු තීරණය කළහ. ප්‍රතිඵලය වූයේ විල්ලෙන පාලම් ය. එය දැකීමට ඉතා ලස්සන සේම ශක්තිමත්ය. ඇත්තවශයෙන්ම එය මකුළු දැලට සමාන පෙනුමකි. මෙකල මේ වර්ගයේ පාලම් බොහෝ ගණනක් සාදනු ලැබේ.

ටික කලකට පෙර, විශාල ක්‍රීඩාගාරයන් තනනු ලැබුවේ ඝන වානේ රැහැන් වලින් එල්ලුනු පියැසි වලිනි. දුර සිට බලන විට එය පෙනෙනුයේ මකුළු දැලක් ලෙසින්මය.

ඔබ වනාන්තරයෙහි ඇවිදින්නට යන්නේ නම් වටපිටාවෙහි ඇති සියල්ල අධ්‍යයනය කරන්න. සිත් ගන්නා බොහෝ දේ ඔබ දැක ඉගෙන ගනු ඇත.

සුදු ලෝම පොදක් කැලයේ මිටියාවතක් හරහා සුළඟින් ගසා ගෙන එනවා විය හැකිය. එහෙත් එය කුඩා සුදු පැරෂුටයක් බිමට බසින්නාක් සේ පෙනෙනු ඇත.



ගුවන් යානය සැබෑ ගුවන් යානයක් වටට පැමිණියේ එයට අවුර පෙත්තක් සවි කළ විටය. එහෙත් බොහෝ දිගු කලක් තිස්සේ ම ගුවන් යානා නටුවල පෙනුම සරුංගල් මෙන් විය.



විශාල බඩු තොගයක් බිමට බස්වන්නට පැරෂූට් කණ්ඩායමක් ම ඕනෑ වේ.

පැරෂූට් භටයින් බිමට බසින්නට සදන අයුරක් ඔබට සතින් සිතා ගත හැකි වනු ඇත. ඩැන්ඩලියන් මල් මේ පැරෂූටයන් සාදන්නේ එහි බීජයන් විසුරුවා හරින්නටයි.

මේපල් ගස සතුවද සොයා ගැනීමක් ඇත්තේය. මේවා නම් වක් වූ කොළ පැහැ තල දෙකකි. ඒවා පෙනුමින් කුඩා හෙලිකොප්ටරයක අවරපෙති මෙනි.*

ඔබ කිසියම් දිනෙක සරුංගලයක් සාදා තිබේද? සමහරවිට ඔබ සාදා ඇති. ඔබ හිස පිටුපසට නවා ගෙන එය ඉහළ නඟින දෙස බලා සිටින්නට ඇති. වේගයෙන් ඉහළ නැඟි එය ඉක්බිති අහසෙහි කිසිවක හැපුනාක් මෙන් පැකිලී මොහොතකින් යළිත් වඩාත් ඉහළට ඇදුනි.

සරත් සමයේදී වනාන්තරයක දී ප්‍රවේශමීකාරීව බැලුවහොත් බිම දිගේ වියළි කොළ සුළඟින් වට රවුමේ ඇදී යන්නේ කෙසේදැයි දැක ගත හැකිය. දැන් යළිත් බලන්න. කහ පැහැ පත්, මෘදු ලෙසින් ඇදී යයි. ඉක්බිති ඒවා වෙව්ලා තම ගමන් මග වෙනස් කරන්නේ හරියටම තම මගෙහි බාධාකාරී කිසිවක් ඇතිවාක් මෙනි. හරියටම සරුංගලය වාගේමය.

* ඔබ දැක ඇති හොර ගස්වල හොර කුරුල්ලන් ද මේ සමානමය. -පරිවර්තක



බැලූනය සුළඟ ගෙන යන දිනෑම තැනකට යයි. එය පාලනය කිරීම ඉතා අසීරුය.



මුල් කාලයේ ගුවන් යානාවල පෙනුම අත්හටු විහිදා ගත් කුරුල්ලන් මෙන් විය.

සමහරවිට මිනිසුන් සරුංගලයක් ගැන සිතන්නට ඇත්තේ සරත් සමයේ ඉහිලී යන කහ පැහැ කොළ දෙස බැලීමෙන් පසුව වන්නට ඇත.

පසුව මිනිස්සු තමන්වත් රැගෙන යා හැකි වඩාත් විශාල හා සංකීර්ණ සරුංගල් සෑදීමට ඉගෙන ගත්හ. සරුංගලය ග්ලයිඩර නැතිනම් සැහැල්ලු ගුවන් යානා බවට හැරිණි. ඒවා ගුවන් යානා වගේමය. එහෙත් ඒවාට එන්ජින් නැත. දැන් මිනිසාට අත්තටු ද තිබේ.

ඒත් ඇයි මිනිසුන්ට ඉහළ අහසෙහි පියෑඹීමට ඕනෑ වූයේ? ඔවුනට ඒ අදහස දුන්නේ කුමක් විසින්ද? පෙනෙන ලෙසින් නම් ඒ කුරුල්ලන්ය. කිසිදු කුරුල්ලෙක් නොසිටියා නම් මිනිසා තටු පිළිබඳව කිසිදා දැන නොගන්නට ඉඩ තිබිණි. පියෑඹීම යනු කුමක්දැයි ඔහු කිසිදාක දැන නොගන්නට ඉඩ තිබිණි.

ඉතිං, සරුංගලය, ග්ලයිඩරය, ගුවන්යානය හා පැරෂුටය සොයා ගන්නට, සරත් සමයේ තුරු පත්, කුඩා හා විශාල කුරුල්ලෝ සහ ඩැන්ඩලියන්වලත් මේපල් වලත් බීජ දැරූ පැරෂුට, මිනිසාගේ සිත පෙළඹවූහ.





ලෝකයේ පළමු ගුවන් යානය මින් අවුරුදු එකසිය තිහකට පමණ පෙර රුසියානු ඉංජිනේරුවරයකු වූ අලෙක්සැන්ඩර් මොෂෙයිස්කි විසින් නිපදවන ලදී.

සියළු ගුවන් යානාවල පෙනුම කුරුල්ලන්ගේ මෙනි. ඒත් ඒවා කුමන කුරුල්ලෙකුටත් වඩා දුර ඇතට, වඩා වේගයෙන් හා වඩා ඉහළින් පියාඹයි.



පල්ලි මාළුවාගේ කන

සහ

කටුස්සා සිය ගුල අතහැර යාම

සියලු බළලුන්ට, බල්ලන්ට, තාරාවන්ට, ගේ කුරුල්ලන්, ඇත්ත වශයෙන්ම බොහෝ සිව්පාවුන්ට හා කුරුල්ලන්ට කාලගුණය කෙසේ වනු ඇතිදැයි කිව හැකිය. පූසෙක් බැම්මක් මතට වී නිය උල් කරනවා නම් වැස්සක් අත ළඟය. ඌ උගේ ගාත් වලින් මුහුණ වසා ගනී නම් හිම පතනයක් ළඟ එමින් තිබේ. නමුත් ඌ උඩුබැලිව පා උඩ දමා බිම පෙරැළේ නම් දවස උණුසුම් හා වියළි එකක් වනු ඇත.

කාලගුණය සීතලට හැරෙන්නට යන විට තාරාවෙක් උගේ හොට තටු අතර සඟවා ගනී. මුහුදෙහි වැසි ඇද වැටෙන විට ගේ කුරුල්ලෝ පනිමින් දුහුවිලි නාති. එහෙත් කුරුල්ලන්ට හා සිව්පාවුන්ට වැස්ස, සුළඟ, හිම පතනය හා උණුසුම් දිනයන් යනාදියට වඩා වැඩියෙන් අනාවැකි කීමට හැකිය.

ඉතාම සාමාන්‍ය, බැටළුවන් ගාල් කිරීමට යොදා ගන්නා බල්ලෙක් එක් භූ විද්‍යාඥයකුට සිටියේය. විද්‍යාඥයා දිනක් හැන්දෑවේ තම ලියන මේසය අසල හිඳගෙන හුනි. ඔහුගේ සිඟිති දියණිය සිටියේ අසලක වූ අත දරුවන්ගේ කරත්තයක නිදා ගනිමිනි. බල්ලා මුල්ලක කිරා වැටුණි. සියල්ල සාමකාමී හා නිසල විය. එක්වනම බල්ලා උඩ පැන කටින් සිඟිත්තියගේ ඇඳුම අල්ලා, ඇය කරත්තයෙන් පිටතට ඇදගෙන දොර දෙසට පැන්නේය. භූ විද්‍යාඥයා මහත්සේ බිය පත් විය. ඔහු සිතුවේ බල්ලාට පිස්සු හැදී ඇති බවයි. රයිෆලය ඩැහැගත් ඔහු ගෙන් පිටතට දිව්විය. එවිටම පොළොව සෙලැවෙන්නට වී ගෙය කඩා වැටිණි. ඇරඹී තිබුණේ භූමිකම්පාවකි.

බල්ලා මුළු පවුලම බේරාගෙන තිබිණි.



සිව්පාවුන්ට, කුරුල්ලන්ට සහ මාළුවන්ට මහ පොළොවේ යාන්තම් වුව සෙළවීමක් හෝ ක්ෂණික තෙතබරිත බවක් හෝ අසාමාන්‍ය ප්‍රසුතාක් එක්වහම දනේ. මේ සියලු දෙනා ඉතා සංවේදී උපකරණ මෙනි.



කුකුළා එළාම් මරලෝසුවක් මෙනි.
'කොක් කොා කෝක් කෝ....'
හිමිදිරිය පැමිණීම හා සැන්දෑව එළැඹීම සැම සිව්පාවෙකුට ම හා සැම කුරුල්ලෙකුට ම දනේ.

මෙය සිදු වූයේ අෂ්කාබාද් නමැති තුර්ක්මේනියානු නගරයේදීයි. භූමිකම්පාවට දින තුනකට පෙර සර්පයින් හා කටුස්සන් ගුල්වලින් පිටවූ අතර පරෙවියෝ අට්ටාලවලින් පිටවූහ.

එක් රාත්‍රියකදී යුගෝස්ලාවියානු නගරයක් වන ස්කොප්ල්ජේ හි සතුන් වත්තේ මහත් කැළඹීමක් ඇතිවුණා. හයිනාවෝ යටිගිරියෙන් මොර දුන්හ. අලි කුංචනාද කළහ, හිපපොටේමසයෙක් බාධක බිඳගෙන පැන්නේය. කුරුල්ලෝ වේගයෙන් තටු ගැසූහ. පසුදා හිමිදිරි පාන්දරම පොළොව සෙලැවෙන්නට ගත්තේය.

භූගත කුණාටුවක් පැමිණෙමින් ඇති විට සිව්පාවුන්ට හා කුරුල්ලන්ට එය දැන ගන්නට හැකිය. ඉතා දුර යාන්තමින් කෙරෙන කම්පනයක් මිනිසුන් නොදකින්නට හැකි නමුදු එවන් මොහොතක බල්ලෝ, සර්පයෝ, කටුස්සෝ සහ මාළු මහත් සේ කලබලයට පත් වෙති. කිසියම් භයංකර දෙයක් සිදුවන්නට යන බව ඔවුහු දනිති.

බොහෝ අසරණ සේ පෙනෙන කුඩා, විනිවිද පෙනෙන ජල්ලි මාළුවාට පවා මුහුදේ පැමිණෙන කුණාටුවක් ගැන අනාවැකි කිව හැකිය. මුහුදු සංසුන් විය හැකිය. අහසෙහි එකදු වළාවක් හෝ නැතිවා විය හැකිය. එහෙත් ජල්ලියෝ රංචු පිටින් වෙරළට වේගයෙන් ඇදී යන්නේ කුණාටුවෙන් ගැලවෙන්නට ගල්කුළු හෝ පර්වත පිටුපසින් සැඟවීගන්නට නැතහොත් නොගැඹුරු දියට වන්නටය. එහෙත් තවමත් කිසිදු කුණාටුවක් නැත. ආරක්ෂාව පතා ජල්ලීන් වේගයෙන් ඇදුනේ තේරුමක් නැතිවද? කොහෙත්ම නැත. පැය දහයකට නැතිනම් පහළොවකට පසුව මහ සයුර වියරු වැටෙන්නට පටන් ගනී. දිය රැළි වළාකුළු දක්වා නැඟෙයි. වළාකුළු දිය රැළි මතට කඩා වැටෙයි. දැන් මහ සයුර උතුරා නටන්නට වෙයි.



පැමිණෙන කුණාටුව ජල්ලි මාළුවා දැනෙන්නේ කෙලෙසද?

ඌ සතුව විශේෂ කනක් තිබේ. මෙය දියර හා සිහින් ගල්කැට පිරි කුඩා බෝලයකි. කුණාටුවකට බොහෝ පෙරදී මිනිසුන්ට අසාගත නොහැකි තරම් වූ සිහින් අනතුරු හඟවන ශබ්ද දියරැළි පිසගෙන ඇදී එයි. මේ ශබ්ද ජල්ලීන්ගේ කනට ළංවූ සැණින් ඒවා දියරය ඇති බෝලයේ ස්පර්ශ වී සිහින් ගල් කැට සොලවාලයි.

ගල්කැට ජල්ලියාගේ ස්නායු මත තදවී ඌ බියපත් කරයි. බියගෙන දෙන ශබ්ද වලින් පැන යාමට ජල්ලියෝ නොගැඹුරු තැන් බලා වේගයෙන් ඇදී යති.

ජල්ලියාගේ කන සෑදී ඇති සැටි මිනිසා විසින් අනාවරණය කොට ගත් විට ඔහු කුණාටු ගැන අනාවැකි කිව හැකි උපකරණයක් සෑදීය. මේ උපකරණයටද මිනිසාට අසන්නට බැරි සුළඟේ හා රැළි වල ඇති ශබ්ද අසන්නට හැකිය. කිසිවක් සිදුවීමට පැය පහළොවකට පෙර එය නැවක කපිතාන්ට අනතුරු හඟවයි. "බලාගෙනයි! කුණාටුවක් ළඟ එනවා!"

මුහුදේදී නැව් බේරාගත හැකි උපකරණයක් සාදන්නේ කෙසේදැයි ඉන්ජිනේරුවෝ ජල්ලි මාළුවාගෙන් ඉගෙන ගත්හ.



වවුලා හෝහපුටුවන් අල්ලන හැටි

කැස්බෑවා තමන් කැමතිම දූපත
සොයාගන්නා සැටි

සහ
සමනළයින් මහ සයුර තරණය කරන සැටි



ඔබට උත්සාහ කරලා, උත්සාහ කරලා, උත්සාහ කරලා බලන්නට හැකිය.

"ඒත් මං දන්නවා මැස්සෙක් අල්ලන්නේ කොහොමද කියලා."

වවුලාට ගී ගයන්නට හැකි නම් මෙය ඌ ගයන ගීයක් විය හැකිය.

කුරුමිණියන්, හෝහපුටුවන් සහ සමනළයින් අල්ලන්නට වවුලා ඉතා දක්ෂය. ඒ සඳහා ඌට මොහොතක්වත් ගතවන්නේ ද නැත. ඌ උන් පියාඹන අතරේම ගිල දමයි. හෝහපුටුවා සිහින් පාන් රොඩ්ඩක් තරම් කුඩා සතෙකි. එහෙත් වවුලා ඌ සිටින තැන තිත්ත කළුවරේදීත් දකී. කෙසේද? දෝංකාරයේ උදව්වෙනි. නිකම් හිතා බලන්න.

ඔබ වනාන්තරයක් මැද එළිමහනක සිටගෙන උස් හඬින් කෑ ගසා බලන්න. වනාන්තරය ආපසු ඔබට කෑ ගසන්නාක් සේ එම හඬ යළි ඔබටම ඇසෙනු ඇත. සිදුවන්නේ ශබ්දය ගස්වල හැපී ආපසු පැමිණීමයි. ඔබට ඇසෙන්නේ දෝංකාරයයි.

වවුලා ඉගිලෙන්නේ දෝංකාරයේ උදව්වෙනි. ඌ පියාඹන අතරේ සිහින් සිවුරුහම් හඬක් ඇති කරයි. එය උස් තාරතාවයෙන් යුත් නිසා මිනිසාට එම හඬ ඇසෙන්නේ නැත. එම සිවුරුහම් හඬ මදුරුවකුගේ, හෝහපුටුවෙකුගේ හෝ සමනළයෙකුගේ සිරුරේ වැදුණු විට එය ආපසු හැරී වවුලා වෙතම පැමිණෙයි.



අහසේ ගුවන් යානා තිබෙන තැන් දැන ගන්නට මේ රේඩාර් උපකරණ සහය දෙයි.

මුහුදේ සිටින ඩොල්ෆින් ද කෑම සොයද්දී හා ගල් පර අසල පිහිනද්දී යම් කිසි වර්ගයක රේඩාර් තරංගයක් යොදා ගනී.





මේ යාන්ත්‍රික මිනිසෙකි. රොබෝවකි. එය සාදා තිබෙන්නේ මිනිසකුගේ පෙනුම එන ලෙසිනි. එහෙත් එය යන්ත්‍රයක් පමණි.

වවුලා සිටින්නේ කන් දිගු කොටගෙනය. ගොදුර ළඟම බව ඌ තේරුම් ගනී. ඉතිං ඌ මහ මඟ මංකොල්ලකාරයකු සේ සිවුරුහම් හඬ නඟමින් කෑමින් අල්ලා ගනී.

තවත් වඩා වැදගත් දෙයක් ඔබට කියන්නට දැන් මට ඉඩ දෙන්න. වවුලන් ජීවත් වන්නේ ගුහාවලය. සමහරවිට අතිවිශාල රංචු වශයෙනි. එක් ගුහාවක දසලක්ෂ විස්සක් වවුලන් සිටි බව වාර්තා වී ඇත.





හිතලා බලන්න ඒ හැම එකෙක්ම එකම වෙලාවේ දඩයමට එළියට ඇවිත් සිවුරුහම් සද්ද කළොත් මොනවා වේවිද කියා! උන් එකිනෙකාට බාධා නොවී සිටින්නේ කෙසේද? එකෙක් අනෙකුන්ගේ සිවුරුහම් හඬ අතරින් තමාගේ හඬ හඳුනා ගන්නේ කෙසේද? අප සතුව මේ ප්‍රශ්නවලට තවමත් පිළිතුරු නැත.

ඉංජිනේරුවෝ බොහෝ දිගු කාලයක් තිස්සේ වවුලන් අධ්‍යයනය කොට තිබේ. එවැනිම වූ සංවේදී අතිධ්වනික උපකරණ, ට්‍රාන්ස්මීටර සහ රිසීවර සෑදීමට ඔවුනට උවමනාය. එසේම වවුලන් දස ලක්ෂ විස්සක් එකිනෙකාට බාධා නොවී දඩයම් කරන්නා සේ, එකවර ලක්ෂ ගණනක් වුව වැඩ කරන විට එකිනෙකාට බාධා නොවෙන ට්‍රාන්ස්මීටර සහ රිසීවර සෑදීමට ඔවුනට උවමනාය.

රැට්ල් ස්නේක් නම් විෂඝෝර සර්පයා සතුව ද දක්ෂ සහ සංවේදී අවයවයක් තිබේ.

රැට්ල් ස්නේක් දඩයමට ප්‍රිය කරන්නේ රාත්‍රියටය. මී පැටවුනි, බලාගෙනයි! රැට්ල් ස්නේක් නුඹලාව රෑ අන්ධකාරයේත් සොයා ගනු ඇති. ඌට නුඹලා පෙනෙන්නේ හෝ නුඹලාගේ ගඳ සුවඳ දැනෙන්නේ නැත. එහෙත් ඌ නුඹලා සොයා ගනු ඇති. මක්නිසාද යත් ඌට උණුසුම හඟින්නට හැකි බැවිනි. මීයකු නිතරම රාත්‍රියේ සීතල කොළවලට, තණකොළ වලට වඩා උණුසුම් ය.

සතුනට තම මඟ සොයා ගන්නට නාරකා, හිරු, ප්‍රසුම සහ වායු ධාරා උදව් දේ. අපි ඔවුනගෙන් ඉගෙන ගත යුත්තෙමු.

කුඹියා නිතරම තම කුඹ ගුල ඇති තැන දනී. කටුස්සා උගේ ගුල ඉතා ඉක්මනින් සොයා ගනී.



දුර ඇත සිට වුව උණුසුම් වස්තුවක් පිළිබඳ රැට්ල්ස්නේක්ට දැනේ. තණකොළ පෙත්තන්ට හා මෝරුන්ට ද එසේ මය.

රැට්ල් ස්නේක්ගේ මුහුණෙහි ඉතා සිහින් සිදුරු පවතී. මේවා නැහැ පුඬු හෝ ඇස් නොවේ. ඒ ඉතා සියුම් උෂ්ණත්වමානයකි. මේ සිදුරු වලින් උණුසුම හඟින රැට්ල් ස්නේක් කෙළින්ම ඒ කරා ඇදෙයි. රැට්ල් ස්නේක් සතු අවයවය මෙන් ඉතා කුඩා හා සංවේදී උෂ්ණත්වමානයක් සාදා ගන්නට මිනිසා තවම දන්නේ නැත.

සාමාන්‍ය බළලෙකුට ද අසාමාන්‍ය අපූරු උපකරණයක් තිබේ. ඒ උගේ නිය ය. ඔබේ අම්මා කුස්සියේදී පාවිච්චියට ගන්නා පිහිය සහ කීපයකදී මොට්ට වී යයි. එයින් පාන් ගෙඩියක් හෝ කපා ගන්නට බැරි වනු ඇත. එහෙත් බළලාගේ නිය සහ කොට්ටෝරුවාගේ හොට කිසිදා මොට්ට නොවේ. මක්නිසාද යත් ඒවා ඉබේ මුවහත් වන හෙයිනි. අපේ කර්මාන්තශාලා වල මොට්ට නොවන නැතිනම් පතුරු ගැලවී නොයන, ඉබේ මුවහත්වන ඩ්‍රිල් කටු, කපන තල, කියත් සහ කපන කටු තිබීම අපූරු නොවේවිද!



බළලකුගේ නිය නිතරම උල්ය. එවන් පිහි හා කතුරු අපට ඇත්නම් අපූරු ය.

බළලාට රාත්‍රියේ දී දකින්නට හැකිය. 'රාත්‍රී ඇස් කණ්ණාඩි' නිපදවා ගන්නට අපට හැකි වුමොන්!



දැන් අපි ආපසු සාගරයට යමු. වැඩෙමින් ඇති දූපත් තිබෙන බවක් පෙනෙයි. මේවා සැබෑ දූපත් ය. එහෙත් ඒවා නිමවන්නේ ජීවමාන ප්‍රාණීන් විසිනි. එනම් කොරල් බහුපාදිකයන් විසිනි. එක් එක් බහුපාදිකයාට පිට කටුවක් තිබේ. බහුපාදිකයෝ ජීවත්වන්නේ ඉතා ළංව එකටය. එහෙත් උහු පැහැදිලිවම රණ්ඩු නොවෙති. පිට කටු ඔවුන් එකිනෙකා වෙත අලවා තබයි. එයින් කොරල් ඉහළට ඉහළට වැඩෙයි. අන්තිමේ කොරල් දූපතක් දක්වාම ගොඩනැඟෙයි.

වැව් වේලි සහ ගෙවල් හදනවා වෙනුවට ඒවාට වැඩෙන්නට දෙන්නට මිනිසාට ඉගෙන ගත හැකි නම්! සමහරවිට වේලි සහ නිවෙස් තනන්ටත් ගොඩබිම මත උස් කුළුණු තනන්නටත් සමහර විට අපට කොරල් පුහුණු කරන්නට හැකි වනු ඇත. නොඑසේ නම් මේ සියල්ල කළ හැකි කෘත්‍රිම කොරල් සොයාගත හැකි වනු ඇත.

අපි දැන් සිටින්නේ මුහුදේ නිසා වට පිට හැරී අපට පෙනෙන දෑ දෙස බලමු. පියාඹා යන මාළුවකු වූ පියාමැස්සෙක් පෙනෙන්නට ඇත. ඌ දිය යටින් පිහිනයි: දිය මතුපිටින් ලිස්සා යයි: එපමණක් නොවේ දියෙන් උඩට පනී. එය නිකම්ම පිම්මක් නොවේ. ඌ ගුවනෙහි පියාඹා යයි. ඌ මෙන් දියෙන් උඩට පැන පියාඹන, දිය මත ඇදෙන එසේම දිය යට කිමිදෙන නැවක් අපට සෑදීමට හැකි නම් අපූරු වනු ඇත!



කොරල් හෝ කොරල් පර මුහුදේ දිය රැළිවල පහර උරාගෙන වෙරළ ආරක්ෂා කරයි.



අපූර්ව පණුවෙක් මුහුදු පතුලේ ජීවත් වෙයි. ඌ ඉතා ක්‍රියාශීලී පණුවෙකි. ඌ උගේ දළය රොන්මඩ අතරට විදී. එවිට දළයේ ඇති ඉතා කුඩා ඉඳිකටු වැනි තුඩු එළියට විත් රොන්මඩෙහි බැඳී ගෙන පණුවා ඉදිරියට අද්දාලයි. එම පණුවාට මෙන් දළයකින් විද පස විනිවිද පාර සාදාගෙන පොළොව යටින් යන මෝටර් රියක් සාදන්නට අපට හැකි නම්! එවිට එමඟින් අපට පොළොව යට ගල් අඟුරු, තෙල්, යකඩ සහ රිදී සොයා යා හැකි වනු ඇත.

කැස්බෑවෝ තමන්ගේ ප්‍රියතම දිවයිනට එය කොතෙක් දුර ඇත තිබෙන්නේ වුව යළි යළි එහි එති.

කෝමල සමනළයා බියෙන් තොරව සාගරය හරහා පියාඹා යයි. තල්මසා ලෝකය පුරා ගමන් කරයි. යෝධ මුහුදු කැස්බෑවා මහ සයුරේ අතිමහත් දුර ගමන් ජීනමින් නිරතුරුවම තමන්ගේ වාසස්ථානයට මඟ සොයා ගනියි.

ඇයි සමනළයින්, තල්මසුන් සහ කැස්බෑවන් අතරමං නොවන්නේ? තමන් යා යුත්තේ කොහේටදැයි උන් දැන ගන්නේ කෙසේද? කිලෝමීටර් දහස් ගණනක් ඈත සිටියදී තමන්ගේ වාසභූමිය තිබෙන්නේ කොහිදැයි උන් දැන ගන්නේ කෙසේද? මේවාට පිළිතුරු සොයා ගෙන ඒවා ප්‍රයෝජනයට ගැනීම ඉතා වැදගත් දේ වනු ඇත.

මිනිසා ඉගෙන ගන්නේ තමා වටා වූ ලෝකයෙනි.



ISBN 978-955-1889-05-0

මුද්‍රණය සහ ප්‍රකාශනය

සයුරි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්

අංක: 102/176

මත්තේගොඩ නිවාස සංකීර්ණය පාර - මත්තේගොඩ

දුර : 0115 - 676483 - 0715 - 181421

ෆැක්ස් : 0112 - 844961

180/-